## ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2014

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 05 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනතේ 21(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලයට අදාලව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතුව තිබූ රඳවුම් මුදල් රු.350,713 ක්, රඳවාගත් මුදල් ගිණුමට බැර කිරීම වෙනුවට මුදල් පොතට බැර කිරීම නිසා 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.350,713 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ තිබුණු රු.932,952 ක් වටිනා තොග, අවසන් ගිණුම් තුලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි තොගය ගිණුම්වල ගැලපීම වෙනුවට වර්ෂය තුළදී ගබඩාවට ලැබුණු තොග අයිතම 249 ක අගය වූ රු.5,985,980 ක් අවසාන තොගය ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල රු.1,667,177 ක වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වය හා ප්‍රතිඵලයට ප්‍රතිෂ්ඨාපනය කිරීම වෙනුවට ඉකුත් වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

## 2.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති,රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | <u>1971 අංක 38 දරන මුදල් පනත</u><br>8 (1) වගන්තිය | අයවැය ලේඛනය මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය 2014 පෙබරවාරි 25 දින අනුමත කර තිබුණි. |
| (ආ) | <u>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ</u><br>2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ලේඛනයේ අයවැයගත ශේෂපත්‍රය, අයවැයගත ආදායම් වියදම් ප්‍රකාශය හා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.3,251,730 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,115,201 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,136,529 ක පිරිහීමක් දක්නට ලැබුණි. වර්ෂයේ ආදායම රු.16,564,721 කින් වැඩිවී තිබුණත් වර්ෂයේ වියදම රු.18,701,250 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම පිරිහීමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විද්‍යාලයේ ප්‍රධාන මුරපොල පරීක්ෂාවේදී ස්ථාවර නියෝග හඳුන්වාදී නොතිබීම, සැපයුම්කරුවන් විසින් භාණ්ඩ විද්‍යාලයට රැගෙන එන විට හා රැගෙන යන විට ප්‍රධාන මුරපොලේදී විධිමත් පරීක්ෂාවකට ලක් නොකිරීම, අදාල ලේඛනවල අවශ්‍ය සටහන් නොයෙදීම හා විද්‍යාලයෙන් පිටතට භාණ්ඩ රැගෙනයාමේදී ගේට්ටු අවසර පත්‍ර භාවිතා නොකිරීම හේතුවෙන් පාලන ක්‍රම දූර්වල මට්ටමක පවතින අතර ඒ හේතුවෙන් වැරදි හා වංචා ඇතිවීමේ ප්‍රවණතාවයද ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයට අනුකූල වන ලෙසට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදයේ සඳහන් පරිදි ලංසු විවෘත කිරීමේ සටහන් පවත්වා නොතිබුණි.

(ඇ) විෂය පිළිබඳ විශේෂඥ පුද්ගලයින් තාක්ෂණික ඇගැයීම් කමිටුවට පත්කර නොතිබුණි.

(ඈ) මාණ්ඩලික විද්‍යාලය විසින් මුලුතැන්ගෙයි උපකරණ මිලදී ගැනීම සඳහා 2014 පෙබරවාරි 25 දින ලංසු කැඳවා තිබූ අතර 2014 මාර්තු 05 දින ලංසු විවෘතකර තෝරාගත් ආයතන තුනකින් රු.1,897,852 ක් වටිනා මුලුතැන්ගෙයි උපකරණ මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

i. Tilliting Bratt Pan උපකරණය රු. 338,500 ක අවම මිලට මිලදී ගැනීම සඳහා තාක්ෂණ ඇගැයීම් කමිටු නිර්දේශය ලබාදී තිබුණි. එසේ තිබියදී ප්‍රසම්පාදන මගපෙන්වීමට පටහැනිව ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ අනුමැතිය පරිදි වැඩිම මිල වූ රු.675,000 කට ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් ඉහත උපකරණයෙන් ඒකක දෙකක් මිලදී ගැනීම නිසා විද්‍යාලයට රු.673,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

ii. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.5 ඡේදය අනුව භාණ්ඩ මිලදී ගැනීමේදී ණයවර ලිපියක් මත සියයට 30 ක අත්තිකාරමක් ගෙවිය හැකි වුවද බත් පිසින (Rice Steamer) උපකරණය මිලදී ගැනීමේදී ඊට පටහැනිව රු.146,402 ක් වූ සියයට 80 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 අනුව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ ලංසු කැඳවීමේ අවම කාලය දින 7 ක් වුවත්, වටිනාකම රු.1,272,320 ක් වූ වායු සමීකරණ යන්ත්‍ර 4 ක් මිලදී ගැනීම සඳහා 2014 නොවැම්බර් 26 දින ලංසු කැඳවා තිබුණු අතර භාරගන්නා අවසාන දිනයද එදින පෙ.ව. 11.00 ලෙස දක්වා තිබුණි.

**4.3** වාහන උපයෝජනය

ආරක්ෂක අමාත්‍යාංශය හා යුධ හමුදාව සතුව පැවති රු.**51,586,500** ක පිරිවැය වූ වාහන විද්‍යාලයේ කටයුතු සඳහා වසර ගණනාවක් තිස්සේ උපයෝගී කරගෙන තිබුණත් එම වාහනවල හිමිකාරිත්වය විද්‍යාලය වෙත පවරාගෙන නොතිබුණි.

**5.** ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

**5.1** සංයුක්ත සැලැස්ම

**2014** වර්ෂයට අනුකූල වන පරිදි සංයුක්ත සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

**5.2** ක්‍රියාකාරි සැලැස්ම

**2014** වර්ෂයේ මාණ්ඩලික විද්‍යාලය විසින් සකස් කර තිබූ ක්‍රියාකාරි සැලැස්මේ විද්‍යාලයේ ප්‍රාග්ධන වියදම් හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරීමට අපේක්ෂිත වියදම් ඇතුළත් කර තිබූ අතර ඒවා ශිෂ්‍ය නිලධාරීන්ගේ අධ්‍යයන කටයුතු පවත්වා ගෙන යාම් ඇතුලු අනෙකුත් ප්‍රධාන අරමුණුවලට අදාල කරගන්නා ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් සකස් කර නොතිබුණි.

**6.** පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සභාපතිවරයා වරින් වර දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ප්‍රසම්පාදනය
(ආ) භාණ්ඩ සමීක්ෂණ කටයුතු
(ඇ) ගිණුම් පොත් පැවැත්වීම
(ඈ) අත්තිකාරම් ගෙවීම
(ඉ) අයවැය පාලනය